සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**6 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **62 S I,II**

**නම: ..........................................** | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය පැය දෙකයි**

**★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**★ මෙම කොටසට එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 40 ක් හිමි වේ.**
**★ ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

01) පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු ...................................................... ලෙස හැඳින්වේ.

02) නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස හඳුන්වන්නේ ................................................ මහතා ය.

03) කාර්යක්ෂමව කටයුතු කිරීම අපට සේවා සපයන ආයතනවල ................................................ වේ.

04) රාජ්‍ය ඔසුසල නිර්මාතෘ වන්නේ ................................................ මහතා ය.

05) පාසල් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය අවම පහසුකම් ලැබීම ඔබ සතු ........................................ වේ.

(සේනක බිබිලේ, පාසල් ඉතිහාසය, අයිතිවාසිකමක්, යුතුකමක්, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර)

**★ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06) ස්වභාවධර්මයේ දායාද භාවිත කරමින් මිනිසා විසින් නිර්මාණය කළ දෑ නිර්මිත සම්පත් නම් වේ. ( )

07) ලොග් සටහන් පොත, පාසලේ ඓතිහාසික තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රයක් නොවේ. ( )

08) උප්පැන්න සහතික නිකුත් කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගිනි. ( )

09) පාසලේ පවත්නා සම්ප්‍රදායන් පාසල් සංස්කෘතියට අයත් නොවේ. ( )

10) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග 03 ක් දක්නට ලැබේ. ( )

**★ ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11) අප රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,
1. ගමයි
2. ග්‍රාම නිලධාරී කොට්ඨාසය යි
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි
4. දිස්ත්‍රික්කය යි

12) පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයක් නොවන්නේ,
1. පාසල් ලාංඡනය යි.
2. පාසල් කොඩිය යි.
3. ජාතික කොඩිය යි.
4. මෙහෙවර ප්‍රකාශය යි.

13) උතුරු පළාතට අයත් නොවන දිස්ත්‍රික්කය වන්නේ,
1. යාපනය යි. 2. මොණරාගල යි. 3. මුලතිව් යි. 4. මන්නාරම යි.

14) ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක අන්තර්ගත නොවන්නේ,
1. සම්පූර්ණ නම යි. 2. උපන් දිනය යි. 3. පෞද්ගලික ලිපිනය යි. 4. ස්කන්ධ දර්ශකය (බර) යි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15) පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුර වන්නේ,

1. නියෝජ්‍ය විදුහල්පති ය.
2. අංශ ප්‍රධාන ය.
3. විදුහල්පති ය.
4. ප්‍රධාන ශිෂ්‍ය නායක ය.

**★ ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පින්තූර ඇසුරෙන් පිළිතුරු ලියන්න.**



16) A පින්තූරයෙන් දැක්වෙන ප්‍රතිමාව හඳුන්වන නම කුමක් ද?

..........................................

17) එම ප්‍රතිමාව පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද? ....................................



18) B පින්තූරයෙන් දැක්වෙන්නේ ................................................ යි.

19) එය පිහිටන්නේ පියගැට පෙළක ..................................... පඩිය ලෙසයි.

20) දේශීය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන පහත ආගම ඇසුරෙන් පැවැත්වෙන උත්සව 04 ක් ලියන්න.

1. බෞද්ධ ආගම : ..........................................................
1. කතෝලික ආගම : ..........................................................
2. ඉස්ලාම් ආගම : ..........................................................
3. හින්දු ආගම : ..........................................................

## II කොටස

**★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**★පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**
**★ පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.**

01) i. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක 02 ලියන්න.

1. ..........................................  2. ......................................

ii. ස්වභාවික සම්පතක් වන හිරු එළිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 02 ක් ලියන්න.

හිරු එළිය
1. ....................................................
2. ....................................................



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iii. මෙම ඡායාරූපවලින් දැක්වෙන මානව සම්පත් හඳුනාගෙන නම් කරන්න.



A



B



C

.............................. .............................. ..............................



D



E



F

.............................. .............................. ..............................

iv. ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග 03 ක් ලියන්න. (ල.03)

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

v. මිනිසා විසින් ස්වභාවික පරිසරය තුළ සිදුකරන නිර්මාණ 03 ක් ලියන්න. (ල.03)

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

02) i. පාසලේ සංවිධාන ව්‍යුහය යනු පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතු සංවිධානය වී ඇති ආකාරයයි. පහත දැක්වෙන්නේ පාසල් සංවිධාන ව්‍යුහයක දළ සැලැස්මකි. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

ආදි ශිෂ්‍ය සංගමය | A. | පාසල් සංවර්ධන කමිටුව

↓

නියෝජ්‍ය විදුහල්පති

↓

B.

↓

ශ්‍රේණිභාර ගුරුවර / ගුරුවරියන්

↓

C.

↓

පන්ති නායක / නායිකා

↓

D

(ල.04)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ii. පාසලේ ශිෂ්‍ය/ ශිෂ්‍යාවක වශයෙන් ඔබ සතු යුතුකම් 03 ක් ලියන්න. (ල.03)

.........................................................................................................

.........................................................................................................


.........................................................................................................

iii. ජීවිතයේ සෑම පුද්ගලයෙකුටම අභියෝගවලට මුහුණදීමට සිදුවේ. ඔබ මුහුණ දුන් අභියෝග ඇසුරෙන් පහත සටහන සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| අභියෝගය | 1. |
| ජයගැනීමට කළ දේ | 2. |
| ඔබට ලැබුණු ප්‍රතිඵලය | 3. |
| දෙමාපියන්ට ලැබුණු ප්‍රතිඵලය | 4. |

(ල.04)

03) i. පාසල හා අවට ප්‍රජාව අතර පවතින සබඳතාව පහත රූප සටහනෙහි දැක්වේ. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.




(ල.03)

ii. ළමා මිතුරු පාසල් පරිසරයක හඳුනාගත හැකි ලක්ෂණ 02 ක් ලියන්න.

1. ........................................................ 2. ........................................................ (ල.02)

iii. A තීරුවේ සඳහන් තොරතුරු හා ගැළපෙන පිළිතුර B තීරුවේ ඇත. ඒවා නිවැරදිව යා කරන්න.

| A | A |
|---|---|
| 1. මහ නගර සභාවක ප්‍රධානියාය | A. විදුහල්පතිතුමා |
| 2. පුද්ගලයා සතු දුර්වලතාවයකි | B. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම |
| 3. ශිෂ්‍ය සංවර්ධනයට පාසලෙන් ලැබෙන අවස්ථාවකි | C. නගරාධිපතිතුමා |
| 4. සැලසුම් සහගත ශිෂ්‍යයා | D. අලසකම |
| 5. පාසල් සංවර්ධන කමිටුවේ සභාපතිවරයා ය | E. පහසුවෙන් අභියෝග ජයගනී |
| 6. සමාජයේ ක්‍රියාත්මක වන සරු දෙයකි | F. ගුරු උපහාර උත්සවය |

(ල.06)

04) i. පළාත් පාලන ආයතන වර්ග

1. ...................................... 2. ...................................... 3. ...................................... (ල.03)


ii. ඉන් එක් ආයතනයකින් ඉටුවන කාර්යන් 03 ක් ලියන්න.

1. ...................................... 2. ...................................... (ල.03)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iii. ඔබ ප්‍රදේශයේ ඇති සමිති සමාගම් ඇසුරෙන් පහත සටහන සම්පූර්ණ කරන්න.




(ල.05)

05) i. යහපත් පුරවැසියෙකු වශයෙන් ආචාරශීලී කථනය ප්‍රගුණ කළ යුතුය. ආචාරශීලී කථනයේ අංග ලක්ෂණ 04 ක් ලියන්න.

1. .................................................. 2. ..................................................

3. .................................................. 4. .................................................. (ල.04)

ii. සක්‍රියව සවන් දීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න.

1. .................................................. 2. ..................................................

3. .................................................. (ල.03)

iii. මනා විනය හා ශික්ෂණය සඳහා පහත අවස්ථාවන්හි දී ඔබ විසින් කටයුතු කළ යුතු ආකාර 01 බැගින් ලියන්න.

1. පවුලේ දී ..................................................

2. පාසලේ දී ..................................................

3. මහා මාර්ගයේ දී ..................................................

4. සමාජයේ දී .................................................. (ල.04)

06) i. පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත 04 ක් ලියන්න.

1. .................................................. 2. ..................................................

3. .................................................. 4. .................................................. (ල.02)

ii. පාසල් ගීතය ගායනා කරන අවස්ථා 03 ක් ලියන්න.

1. .................................................. 2. ..................................................

3. .................................................. (ල.03)

iii. පාසල් සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ඔබට හිමි අයිතිවාසිකම් 04 ක් සහ ඒ හා බැඳි යුතුකම් 04 ක් පහත වගුවෙහි සඳහන් කරන්න.

| ඔබ සතු අයිතිවාසිකම් | එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් |
|---|---|
| 1. ............................................ | ............................................ |
| 2. ............................................ | ............................................ |
| 3. ............................................ | ............................................ |
| 4. ............................................ | ............................................ |

(ල.04)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07) i. සම්ප්‍රදායන් හා නීති රීතිවලට අවනත වීම තළින් සමාජ යහපත උදාවෙයි. පහත දැක්වෙන්නේ සම්ප්‍රදායන් හා නීති අන්තර්ගත සටහනකි. ඒ ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

A. වැඩිහිටියන්ට ගරු කිරිම
B. මාර්ග නීති අනුගමනය කිරිම
C. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුගතව කටයුතු කිරිම
D. තම සංස්කෘතික උරුමයන් රැක ගැනීම
E. සමාජයේ ඇති සිරිත් විරිත් ගරු කිරිම

| සමාජයේ ඇති සම්ප්‍රදායන් | යහපත් පාලනයක් සඳහා පනවා ඇති නීති |
|---|---|
| 1.............................<br>2.............................<br>3............................. | 4.............................<br>5............................. |

(ල.05)

ii. පොදු දේපළ සුරැකීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල.02)

1. ............................................................ 2. ...................................................

iii. පහත වගුවෙහි සඳහන් පරිසර අංග දූෂණය වීමට බලපාන හේතු 01 බැගින් සඳහන් කරන්න. (ල.02)

| පරිසර අංගය | දූෂණයට හේතුව |
|---|---|
| 1. ජලය | ............................................. |
| 2. ගොඩබිම | ............................................. |
| 3. වායුගෝලය | ............................................. |
| 4. ශබ්දය | ............................................. |

(ල.04)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**පුරවැසි අධ්‍යාපනය - 6 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I කොටස**

01) පාසල් ඉතිහාසය 02) සී.ඩබ්.ඩබ්. කන්නන්ගර 03) යුතුකමක් 04) සේනක බිබිලේ 05) අයිතිවාසිකමක් 06) ✔ 07) x 08) ✔ 09) x 10) ✔ 11) ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි 12) ජාතික කොඩිය 13) මොණරාගල 14) ස්කන්ධ දර්ශකය (බර) 15) විදුහල්පති 16) අවුකන ප්‍රතිමාව 17) අනුරාධපුර 18) සඳකඩපහණ 19) පහළව 20) බෞද්ධාගම - වෙසක්, පොසොන්, ඇසළ / කතෝලික - නත්තල්, පාස්කු ඉරිදා, මහා සිකුරාදා / ඉස්ලාම් - හජ්ජ්, රාමසාන් / හින්දු - තෛපොංගල්, දීපවාලි, හෝලි

**II කොටස**

01) i. කුරුණෑගල, පුත්තලම ii. ආලෝකය, බලශක්තිය iii. A. වෛද්‍යවරයා, B. ගුරුවරයා, C. ගොවියා D. සංගීතඥයා, E. ඉංජිනේරුවා (කාර්මික ශිල්පියා), F. පොලිස් නිලධාරියා iv. ජලයට අපද්‍රව්‍ය බැහැර නොකිරීම, අවශ්‍ය ප්‍රමාණයට පමණක් පරිභෝජනයට ගැනීම, ජල කාන්දුවීම් පිළිසකර කිරීම ආදී පිළිතුරු v. පරිගණක හා විදුලි උපාංග, ලී බඩු, වාහන, උළු ගඩොල්, ගොඩනැගිලි ආදී පිළිතුරු

02) i. A. විදුහල්පති, B. අංශභාර ගුරුවර ගුරුවරියන්, C. ශිෂ්‍ය නායක නායිකා, D. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ii. දිනපතා පාසල් පැමිණීම, හොඳින් ඉගෙන ගැනීම, විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයට ගරු කිරීම ආදී පිළිතුරු iii. අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න (23 පිටුව)

03) i. දෙමාපියන්, පූජනීය උතුමන්, මහජන නියෝජිතයන් ii. සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් ඇත, ජලය හා සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ඇත... ආදී පිළිතුරු (45 පිටුව) iii. 1 - C. නගරාධිපතිතුමා 2 - D. අලසකම 3 - F. ගුරු උපහාර උත්සවය 4 - E. පහසුවෙන් අභියෝග ජයගනී 5 - A. විදුහල්පතිතුමා 6 - B. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම

04) i. මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ii. 63 - 65 පිටු iii. බෞද්ධ සමිති, සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, අවමංගල්‍යාධාර සමිති, පරිසර සමිති, ණය දෙන සමිති

05) i. සංවරශීලීව කතා කරයි, නිවැරදි හා නිරවුල් අදහස් දක්වයි, අන් අයට ගෞරවයෙන් සලකයි, භාෂාව විකෘති නොකරයි, • මුහුණට මුහුණ බලා කතා කරයි... ආදී පිළිතුරු (73 පිටුව) ii. පණිවිඩ නිවැරදි ලෙස අවබෝධ කරගනී, පණිවිඩයට උචිත ප්‍රතිචාර දක්වයි, යහපත් සමාජ සබඳතා ගොඩනැගේ........ ආදී පිළිතුරු (76 පිටුව) iii. අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න (80 පිටුව)

06) i. ආදර්ශ පාඨය, පාසල් ලාංඡනය, පාසල් කොඩිය, පාසල් ගීතය, පාසලේ දැක්ම, මෙහෙවර ප්‍රකාශය, පාසල් නිල ඇඳුම ii. පාසල ආරම්භයේ දී, පාසලේ පැවැත්වෙන විශේෂ උත්සවල දී, නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී iii. 36 පිටුව

07) i. 1. වැඩිහිටියන්ට ගරු කිරීම 2. තම සංස්කෘතික උරුමයන් රැක ගැනීම 3. සමාජයේ ඇති සිරිත් විරිත් ගරු කිරීම 4. මාර්ග නීති අනුගමනය කිරීම 5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුගතව කටයුතු කිරීම ii. පොදු දේපළ අයුතු ලෙස භාවිත කිරීමෙන් වැළකීම, භාවිතා කිරීමේ දී කැඩී බිඳී යාමෙන් ආරක්ෂා කිරීම, අන් අයට ද භාවිත කිරීමට අවස්ථාව ලබා දීම ආදී පිළිතුරු (94 පිටුව) iii. 1. අපද්‍රව්‍ය බැහැර කිරීම, රසායනික පොහොර භාවිතය 2. අපද්‍රව්‍ය බැහැර කිරීම, වනාන්තර විනාශය 3. කර්මාන්තශාලාවලින් හා වාහනවලින් පිටවන දුම් 4. ශබ්ද විකාශන යන්ත්‍ර, රථවාහන, පිපිරීම් නිසා හට ගන්නා අධික ශබ්දය



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com